1 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 1- இல. 3
**Volume 1 - No. 3**

2016 නොවැම්බර් 19 වන සෙනසුරාදා
2016 நவம்பர் 19, சனிக்கிழமை
**Saturday, 19th November, 2016**

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය

## නිල වාර්තාව

# அரசியலமைப்புச் சபை

## அதிகார அறிக்கை

# CONSTITUTIONAL ASSEMBLY

## OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය

## அரசியலமைப்புச் சபை

## CONSTITUTIONAL ASSEMBLY

***2016 නොවැම්බර් 19වන සෙනසුරාදා***

*2016 நவம்பர் 19, சனிக்கிழமை*

*Saturday, 19th November, 2016*

**පූ.භා.9.00ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය රැස් විය.**
**සභාපතිතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

அரசியலமைப்புச் சபை மு.ப.9.00 மணிக்குக் கூடியது.

தவிசாளர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Constitutional Assembly met at 9.00 a.m.,
THE CHAIRMAN [ HON. KARU JAYASURIYA] in the Chair.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
Order, please! වාර්තා පිළිගැන්වීම.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව විසින් මූලික අයිතිවාසිකම්, අධිකරණය, මුදල්, නීතිය හා සාමය, රාජ්‍ය සේවය, මධ්‍යම - පර්යන්ත සබඳතාව සම්බන්ධයෙන් පත් කරන ලද අනුකාරක සභා හයේ වාර්තා හය මෙහෙයුම් කාරක සභාවේ සභාපති ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් පිළිගැන්වීම.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. RanilWickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)
ගරු සභාපතිතුමනි, අද වැදගත් අවස්ථාවක්. මෙම සභාව විසින් පත් කරන ලද මෙහෙයුම් කාරක සභාව මඟින් අනුකාරක සභා හයක් පත් කළා. ඒ අනු කාරක සභා හයේ වාර්තා අද මම මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරනවා. එනම්,

1. මූලික අයිතිවාසිකම් පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව;
2. අධිකරණය පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව;
3. මුදල් පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව;
4. නීතිය හා සාමය පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව;
5. රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණය පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව; සහ
6. මධ්‍යම පර්යන්ත සම්බන්ධතා පිළිබඳ අනුකාරක සභාවේ වාර්තාව.

මෙම අනුකාරක සභා වාර්තා සියල්ලම අපේ මෙහෙයුම් කාරක සභාව ලබා ගත්තාට පසුව අපි තීරණය කළා, මෙම අනුකාරක සභා වාර්තා මෙම සභාවට ඉදිරිපත් කරන්න. එම වාර්තා මෙම සභාවට ඉදිරිපත් කරලා මෙම සභාවේ අදහස් ප්‍රකාශ කළාට පසුව පමණයි අපි අපේ මෙහෙයුම් කමිටුවේ තීරණ ගන්නේ.

ඒ වන කල් තීරණ ගන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. විශේෂයෙන් වඩාත්ම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය, සභාවෙන් අදහස් අහලා සභාවේ අදහස් දැනගත්තාට පසුව අපේ වැඩ කටයුතු කරන එකයි. දීර්ඝ වාර්තායි තිබෙන්නේ. මෙය හොඳ පසු බිමක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන්න. මේ සියල්ල ව්‍යවස්ථාවේ අඩංගු වන්නේ නැහැ. එහෙත් ඒ පසු බිමෙන් සාකච්ඡා කරලා ඒ අදහස් අනුව තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කාරක සභාවේ වාර්තාව ලබා දෙන්න අප බලාපොරොත්තු වන්නේ.

මෙම අනුකාරක සභා විශේෂයෙන් විවිධ පුද්ගලයන්, විවිධ සංවිධාන, දේශපාලන පක්ෂ සියල්ල මුණ ගැසුණා. එසේ මුණ ගැසිලා ඒ අයට අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දුන්නා. ඒ නිසා විශේෂයෙන් ඒ අනුකාරක සභාවලටත්, ඒ අනුකාරක සභාවලට උදවු කරන්න පත් කරපු විශේෂඥ පිරිසටත් අපේ ස්තුතිය, මෙහෙයුම් කාරක සභාවේ ස්තුතිය පුද කරනවා.

ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කාරක සභාව දැනට රැස්වීම් 40ක් පවත්වා තිබෙනවා. අපි අංශ ගණනාවක් ගැන සාකච්ඡා කර තිබෙනවා. ඒ කියන්නේ අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ I හා II පරිච්ඡේද ගැන, විශේෂයෙන් රජයේ ස්වභාවය පිළිබඳව, ආගම පිළිබඳව සාකච්ඡා කළා. ඒවායේ වෙනසක් කරන්න අපේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. ඒ අංශ ශක්තිමත් කිරීමත්, හැම කෙනාටම පිළිගන්න පුළුවන් විධියට සකස් කිරීමත් තමයි මෙහිදී සිදු වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා ඒ වෙනුවට විකල්ප තුනක් අපි ලබා දී තිබෙනවා. කාරණා කිහිපයක් තිබුණා. නමුත් විකල්ප තුනක් ලබා දී තිබෙනවා. මේ අවස්ථාවේදී අපට මේ රටේත්, මේ සභාවේත් අදහස් ලබා ගන්න පුළුවන්, ඒ විකල්පවලින් සුදුසු විකල්පය කුමක්ද කියන එක ගැන.

මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් Mixed Member Proportional System එක ගැන - ප්‍රතිපත්තිය පිළිබඳව - කැමැත්තක් හා එකඟත්වයක් අප තුළ තිබුණා, විශේෂයෙන්ම ජර්මානු ක්‍රමයටත් වඩා නවසීලන්ත ක්‍රමය පිළිබඳව. එතැන ඉඳලා ක්‍රියාත්මක කිරීමේදී අපි විකල්ප කිහිපයක් ලබා දීලා තිබෙනවා. එතැන කාරණා දෙකක් තිබෙනවා, ගරු සභාපතිතුමනි. පළමුවන කාරණය, ඡන්ද දායකයින් දීපු ඡන්ද අනුව -ඒ හා සමානව, නැත්නම් එතැනට ළං වන විධියට- අපේ පක්ෂවලට පාර්ලිමේන්තුවේ නියෝජනය ලබා දීම. ඒ අනුපාතය තිබෙනවා.

අපට අවුරුදු පහක ස්ථාවර ආණ්ඩුවක් වුවමනායි. එහෙම නම් කොහොමද, ඒ ස්ථාවරභාවය ලබා දෙන්නේ? අන්න ඒ කාරණය ගැන තමයි අපට සාකච්ඡා කරන්න තිබෙන්නේ. විධායක ජනාධිපති ක්‍රමයේදී ජනාධිපතිතුමා පත් වුණු නිසා යම් කිසි ස්ථාවරභාවයක් තිබුණා. එහෙත් විධායකයේ බලතල සියල්ලම ජනාධිපතිවරයා කේන්ද්‍ර කර ගත්ත නිසා ඒක විශාල අඩුපාඩුවක් බවට පත් වුණා. නමුත් දැන් අපි විධායක ජනාධිපති ක්‍රමයෙන් ඉවත් වෙලා පාර්ලිමේන්තු ක්‍රමයකට එන අවස්ථාවේදී විශේෂයෙන්ම ස්ථාවරභාවය ලබා ගත යුතු ක්‍රමවේදය කුමක්ද කියන එක ගැනත් හිතන්න වෙනවා. එනම් ආණ්ඩුවට පළමුවන අවුරුදු දෙකේදී ලැබිය යුතු ස්ථාවරභාවය පිළිබඳව හිතන්න වෙනවා.

ඊළඟට, අපි බලය බෙදා හැරීමේ මූලධර්ම ගැන සාකච්ඡා කළා. සමහර ඒවා ගැන මේ වාර්තාවල සඳහන් කරලා තිබෙනවා. අනෙක් ඒවා -පොලිස් බලතල, අධ්‍යාපනය වාගේ ඒවා- ගැන අපි අනුකාරක සභා වාර්තාවල සඳහන් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම, ඉඩම් පිළිබඳව කාරණා කිහිපයක් මෙහි ඇතුළත් වෙලා තිබෙනවා. අපි ඉඩම් පිළිබඳ ප්‍රශ්නය අර ගත්තේ

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

වෙනම. මෙහිදී, පිළිගත්ත මත අනුව බොහෝ දුරට අපි සාකච්ඡා කරලා තිබෙන්නේ. ඒ වාර්තාවත් අපි මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා. ඊට පසුව අපි බලාපොරොත්තු වනවා, ජනවාරි මාසයේදී මේ ගැන මූලික විවාදයක් ආරම්භ කරන්න. අපට වුවමනා නම්, එම විවාදය දවස් කිහිපයකින් අවසන් කරන්න පුළුවන්. එහෙමත් නැත්නම්, ඒ විවාදය තව දවස් කිහිපයකට වුවත් ගෙන යන්න පුළුවන්. ඒක තීරණය කරන්න තිබෙන්නේ, පක්ෂ නායකයන්ටයි. අපේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන්ටත්, අපි එක්ක වැඩ කටයුතු කරපු ලේකම්තුමාටත්, අතිරේක ලේකම්තුමියටත්, අනෙක් සියලු දෙනාටමත් අපේ ස්තුතිය පුද කරනවා. ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය මීළඟට 2016 දෙසැම්බර් 10 වෙනිදා රැස්වෙන්න අපි බලාපොරොත්තු වනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මීළඟ රැස්වීම් දිනය ගරු අගමැතිතුමා සඳහන් කළ පරිදි 2016 දෙසැම්බර් 10 වෙනිදා පෙර වරු 9.00ට පැවැත්වෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, දෙසැම්බර් 10 වෙනිදා රැස් වෙන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මීළඟ සාකච්ඡාව සඳහා දින නියමයන් ගැන පක්ෂ නායකයන් අතර සාකච්ඡාවේදී සඳහන් වුණේ, එම රැස්වීම ජනවාරි මාසයේ පැවැත්වීමටයි. නමුත්, මේ අයුරින් හදිසියේ කලබලකාරී ලෙස වැඩ කරනවාට අපේ එකඟත්වයක් නැහැ. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මේ තිබෙන කටයුතු බරපතළයි. ඒ නිසා එකඟ වූ පරිදි ජනවාරි මාසයේ තමයි මීළඟ රැස්වීම් තිබිය යුත්තේ කියලා මම ගරු අගමැතිතුමාගේ අවධානයට යොමු කරනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. RanilWickremesinghe)

ගරු සභාපතිතුමනි, අපි 2017 ජනවාරි මාසයේ 9, 10 සහ 11 දිනවල රැස් වෙන්නයි බලාපොරොත්තු වුණේ. දෙසැම්බර් 10වැනි දිනට දැම්මේ මෙහෙයුම් කමිටුවේ වාර්තාව සූදානම් නම් ඒක ඉදිරිපත් කරන්න විතරයි. එදිනට සාකච්ඡා මොකුත් නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)

වාර්තාව සභාගත කිරීමට පමණයි?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. RanilWickremesinghe)

සභාගත කිරීමට පමණයි. ගරු අනුර දිසානායක මැතිතුමා?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු සභාපතිතුමනි, මූලික වශයෙන් බලන කොට 1978 ගෙනෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවස්ථා 19කදී සංශෝධනය වී තිබෙනවා. එයින් අවස්ථා දෙකක් රටට හිතකර වුවත්, අවස්ථා 17ක්ම තිබෙන්නේ පාලන බලය හොබවන ලද කණ්ඩායමේ බලය තහවුරු කර ගැනීමේ වුවමනාව මත කරන ලද සංශෝධනයි. ඒ නිසා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාව අපිත් පිළිගන්නවා.

ගරු සභාපතිතුමනි, මෙහි ප්‍රධාන ලෙස සාකච්ඡාවට බඳුන් වූ ප්‍රධාන කරුණු තුනක් තිබෙනවා. එකක් අගමැතිතුමා කිව්ව පරිදිම මැතිවරණ ක්‍රමය. ගරු සභාපතිතුමනි, මැතිවරණ ක්‍රමයේදී ස්ථිර වශයෙන්ම රටේ ජනතාවගේ කැමැත්තේ සාධාරණ පිළිබිඹුවක් එම නියෝජිත ආයතන තුළ ඇති විය යුතුය කියන ස්ථාවරය මත තමයි අපේ කරුණු දැක්වීම සහ මැදිහත්වීම තිබෙන්නේ.

ඊළඟට, විධායක ජනාධිපති ධුරය පිළිබඳ ප්‍රශ්නය. ගරු සභාපතිතුමනි, මිනිස් සමාජය, මානව ඉතිහාසය සංවර්ධනය වූයේ තනි තනි අධිකාරින් මත තිබුණු බලයන් පොදු ජනතා සභාවන් තුළට පත්වීම හරහායි. නමුත් ඇත්තටම විධායක ජනාධිපති ධුරය කියන්නේ මානව ඉතිහාසයේ වර්ධනයට ප්‍රති පක්ෂ වූ තනි ඒකාධිපති බලයක් නිර්මාණය කරන දෙයක්. ඒ නිසා විධායක ජනාධිපති ධුරය මුළුමනින්ම අහෝසි විය යුතුය කියන ස්ථාවරයේ තමයි අපි සිටින්නේ.

ඒ වාගේම තුන්වැනි කරුණ ලෙස, සියලු ජනතාවගේ අයිතීන් තහවුරු වීම සඳහා අවශ්‍ය වන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සකස් කළ යුතුව තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මෙය කොතැනක හෝ ගුහාගත වී හෝ කොතැනක හෝ සැඟවී කළ හැකි කාර්යභාරයක් නොවෙයි කියලා. අනිවාර්යයෙන්ම ගරු කථානායකතුමනි, මේ පදනම පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් ලබා ගත යුතුව තිබෙනවා. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් ලබා ගැනීමෙන් පසුව ජනමත විචාරණයකින් ජනතාවගේ කැමැත්ත ලබාගත යුතුව තිබෙනවා.

1972 ව්‍යවස්ථාව වෙන්න පුළුවන්, 1978 ව්‍යවස්ථාව වෙන්න පුළුවන් ඒ කිසිදු අවස්ථාවකදී ජනතාවගේ කැමැත්ත විමසා නොවෙයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරනු ලැබ තිබෙන්නේ. ජනතාවගෙන් විමසන්නේ නැතිවම ජනතාව පාලනය වන නීතියක් සම්මත කර ගත්තා. ඒ නිසා අනිවාර්ය ලෙසම මේ ව්‍යවස්ථාව ජනතාවගේ කැමැත්තකින් තොරවම සම්මත කරගැනීමේ ඉඩ කඩක් නොමැති නිසාම අපි වඩාත් පුළුල්ව ජනතාවගේ වුවමනාවන්, ඔවුන් කල්පනා කරන ආකාරය පිළිබඳව සැලකිල්ලට ලක් කිරීමකින් තොරව හිතුවක්කාරී බලහත්කාර ක්‍රියාදාමයක් හරහා මෙය සාර්ථක කර ගැනීමට නොහැකි වේවිය කියන ස්ථාවරයේ තමයි අප සිටින්නේ, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)

ගරු අගමැතිතුමනි, ඒ ගැන සඳහන් කිරීමක් කරනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, අපි ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් ඉතා පැහැදිලිව මූලධර්ම හැටියට කරුණු 14ක් මඟින් මෙහෙයුම් කාරක සභාවට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඒ මූලධර්ම 14න් පිට කිසි දෙයකට අපගේ එකඟතාවක් නොමැති බව ප්‍රකාශ කරනවා. ඒ වාගේම, ව්‍යවස්ථාවේ විධායක ජනාධිපතිතුමාගේ බලතල අහෝසි කිරීමේදී දැනට පවතින පළාත් සභා පිළිබඳව ජනාධිපතිතුමාට පමණක් තිබෙන බලතලවලට කුමක් වෙයිද, එය අපේ රටේ ඒකාග්‍රතාවය බිඳී ගොස් වෙන වෙන රටවල් බිහි වීමේ කුමන්ත්‍රණයට අපි ගොදුරු වෙයිද කියන ප්‍රශ්න මතු වෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්. ඒ බලතල පිළිබඳ සාකච්ඡාව ගැඹුරින් සිද්ධ වෙලා නැහැ.

ඒ වාගේම අපේ ඒකීය රාජ්‍යයේ අණසක ක්‍රියාත්මක කරමින් රට පුරාම නීති හැදීමට මේ පාර්ලිමේන්තුවට තිබෙන බලය සම්බන්ධව 1987දී ශ්‍රේෂ්ඨාධිකරණය දෙන තීරණයේදී ඒකීය රාජ්‍යයේ අන්තිම කොණට ගිය බව ශර්වානන්ද අග්‍රවිනිශ්චයකාරතුමා ප්‍රකාශ කරලා තිබෙනවා. ඉන් එහාට කිසිම දෙයක් කළ නොහැකි බවත් ඒ නඩු තීන්දුවේ තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට ජනතාවගේ නියෝජිතයන් හැටියට යම් යම් කරුණු සාකච්ඡා කරලා වෙනස්කම් කරන්නට පුළුවන්. නමුත් අපට ජනතාවගේ පරමාධිපත්‍ය උදුරා ගන්නට බැහැ. ජනතාවගේ පරමාධිපත්‍ය ජනතාව විසින් තමයි තීන්දු කළ යුත්තේ.

අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒකීය භාවය ගැන විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවේ උත්තරීතර භාවය, මේ රටට පළාත් සභාවන් එකතු කිරීමේ වැරදි සහ හානිකර භාවය ගැනත්, ඒ වාගේම රට විනාශ වෙන අභාග්‍යයකට පරිවර්තනය කිරීමට එරෙහිවත් අපි ඒකාබද්ධ විපක්ෂය හැටියට සාධාරණව, ප්‍රජාතන්ත්‍රවාදීව කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ කරුණු මත කටයුතු කරන්නට මේ සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය ලෙස කලබල නොවී, -වේගයෙන් ගමන් කරන මේ බුල්ඩෝසර් ක්‍රමය නවත්වලා- මීට වඩා මහජන අදහස්වලට ඉඩ දිය යුතු වෙනවා. මහ ජනතාව අහනවා, මොකක්ද මේ වෙන්නේ කියලා. [බාධාකිරීම්] මහ ජනතාව අහනවා මොකක්ද වෙන්නේ කියලා. [බාධාකිරීම්] මහ ජනතාවට කරුණු දැනගන්නට අවශ්‍යයි. ඔබතුමන්ලා කෑ ගැහුවාට, මේක කෑ ගහලා විසඳා ගන්න පුළුවන් දෙයක් නොවෙයි. මහ ජනතාව අහනවා මොකක්ද මේවායේ තිබෙන්නේ, මොකක්ද මේ කරන්නේ, මොකක්ද මේ වාර්තාවන් කියලා. මේවා මහ ජනතාව අහනවා. [බාධාකිරීම්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමන්ලාට කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මහ ජනතාවට මේ- [බාධාකිරීම්] ඉඩ කඩ සැලසීම පමණයි. මහ ජනතාවගේ අදහස් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හරහා ගෙන එන්න නම් මේක මහජන සාකච්ඡාවක් විය යුතුයි. එසේ නැතිව- [බාධාකිරීම්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි, ඉදිරියේදී ඒ ගැන සාකච්ඡා කරන්නට පුළුවන්. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகுஏ.டி. சுசில் பிரேமஜயந்த - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. A.D. SusilPremajayantha - Minister of Science, Technology and Research)
ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කාරක සභාව -Steering Committee- විසින් ගන්නා ලද තීන්දු අනුව තමයි අද දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේදී ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මෙම අනුකාරක සභා වාර්තා හය සභාගත කළේ. මෙම අනුකාරක සභා වාර්තා හය මේ උත්තරීතර සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා 225දෙනාම පරිශීලනය කරලා, ඒ අනුව තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂ සහ,-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නියෝජිතයන් හරහා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. SusilPremajayantha)
ඔව්. ඒ නියෝජිතයන් හරහා නැවත මෙම මණ්ඩලයට ගෙන ඒමේ අවස්ථාව මේ මොහොතේදී අපට ලැබී තිබෙනවා. මෙහිදී මා සඳහන් කරන්න ඕනෑ, එක් එක් අයගේ හිතු මතයට හෝ ඕනෑකමකට ව්‍යවස්ථා සම්පාදනය කරන්න බැරි බව. ලෝකයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා බිහි වීමේ ඉතිහාසයක් තිබෙනවා. මම මේ අවස්ථාවේදී ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. නමුත්, මහජන නියෝජිතයන් හැටියට අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මූලධර්ම අනුව තමයි හැම විටම කටයුතු කරන්න වන්නේ. එම නිසා මෙහෙයුම් කමිටුව සහ අනුකාරක සභා මඟින් එම මූලධර්ම අනුගමනය කරලා තමයි මේ වාර්තා සකස් කළේ. මෙහිදී මම විශේෂයෙන්ම මේ කාරණය සඳහන් කරන්න ඕනෑ. මේ අනුකාරක සභාවල සියලුම සාමාජිකයන් ඉතාම උනන්දුවෙන්, සම්පත් දායකයන් සහභාගි කරවාගනිමින්, පුළුල් සාකච්ඡා පවත්වමින්, දින ගණනාවක් වෙහෙසිලා තමයි මේ අනුකාරක සභා වාර්තා සකස් කර තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අලුතින් සම්පාදනය කිරීම, නැත්නම් ව්‍යවස්ථා සංශෝධනයක් කරන්න පුළුවන්ද කියන කාරණය වෙනම එකක්. කොහොම වුණත් 1978 සිට අපි අද ඉන්න 2016 දක්වා අවුරුදු 38ක් සංශෝධන 19ක් සහිතවයි මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා අපට නුදුරු අනාගතයේම යම් කිසි නිශ්චිත දවසක් එළැඹෙනවා, මේ සියලු සංශෝධන ගැන සලකා බලන්න. අපි දකිනවා, සමහර සංශෝධන නිසා ව්‍යවස්ථාවේ මූලික හරයට, යම් ආකාරයක ව්‍යවස්ථා මූලධර්ම අනුව, යම් යම් බලපෑම් සිදු වෙලා තිබෙනවා කියලා. ඒ නිසා මේ තිබෙන තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. ව්‍යවස්ථාදායකයේ මූලික කාර්ය භාරය ව්‍යවස්ථා සම්පාදනයයි; නීති සම්පාදනය කිරීමයි. එහෙම නැතිව විමධ්‍යගත අය වැයේ ලක්ෂ 150ක මුදල් ටික බෙදා දීම පමණක් නොවෙයි. ඒවා පසු කාලීනව ආපු කාරණා. එය මන්ත්‍රීවරුන් හැටියට, මහජන නියෝජිතයන් හැටියට සංවර්ධනයේදී වන දායකත්වයක් පමණයි. ඒ නිසා මෙහි මූලික අරමුණ වන ව්‍යවස්ථා සම්පාදනය සඳහා අපි අවධානය යොමු කරන්න ඕනෑ.

උදාහරණයක් වශයෙන් ගත්තොත් මා සභාපතිත්වය දැරූ රාජ්‍ය සේවයේ ප්‍රතිසංස්කරණ පිළිබඳ අනුකාරක සභාවේදී ඉතාම වැදගත් අදහස්, යෝජනා ආවා. ඒ, බලය බෙදීම සම්බන්ධයෙන් නොවෙයි. නමුත්, අපේ රාජ්‍ය සේවය අනිවාර්යයෙන්ම ප්‍රතිසංවිධානය විය යුතුයි කියන එක පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරු 225 දෙනාම පිළිගන්නවා. මා උදාහරණයක් පමණයි කිව්වේ. මෙහිදී යම් යම් සාධනීය ලක්ෂණ මේ හැම අවස්ථාවකදීම සාකච්ඡාවට භාජන වෙලා තිබෙනවා. මේකේ තිබෙන මූලික කරුණු තුනක් සම්බන්ධයෙන් අපි අවසන් එකඟතාවලට පැමිණ නැහැ. එනම්, රාජ්‍යයේ ස්වභාවය, කොයි ආකාරයෙන් ද අපි බලය බෙදා හැරීම සිදු කරන්නේ කියන කාරණය සහ මැතිවරණ ක්‍රමය. මේවා තමයි ව්‍යවස්ථා සම්පාදනයේදී අවධානය යොමු වෙන ප්‍රධානම කරුණු තුන. හැබැයි, ඒ හා සමානවම වැදගත් වන අනුකාරක සභා වාර්තා හයේ කරුණු තිබෙනවා. [බාධාකිරීමක්] විධායක ජනාධිපති ධුරය සම්පූර්ණයෙන් සම්බන්ධ වෙනවා නේ. රාජ්‍යයේ ස්වභාවය, විධායක ජනාධිපති ධුරය මේ ආදී වශයෙන්.

අපේ රටේ පැවැති රාජාණ්ඩුවලින් පස්සේ ජන මත විචාරණයකට නොගියා වුණත්, පළමුවැනි වතාවට අප විසින්ම සම්පාදනය කරපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි, 1972 ජන රජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ඒ

[ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා]

පළමු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ අනිකුත් ප්‍රගතිශීලී දේශපාලන පක්ෂත් එක්ක ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළාය කියලා මෙහිදී මා ඉතාම පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. අප අතර විවිධ මත තිබෙන්න පුළුවන්. එතැනදී තමයි පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය සහ Chambers දෙකක් වෙනුවට එකක් නිසා ඒකීයභාවය කියන කාරණයත්, ඒ වාගේම බුද්ධාගමට හිමි තැන, ප්‍රමුඛතාව කුමක්ද කියන කාරණයත් ව්‍යවස්ථාගත කළේ. අපි 1972 ජන රජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේ මූල ධර්ම ගරුකොට තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට කටයුතු කරන්නේ.

මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මෙයයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපේ මධ්‍යම කාරක සභාව අතිගරු ජනාධිපතිතුමාත් සමඟ සාකච්ඡා කරලා තමයි මේ පිළිබඳව අපේ මත; අදහස් ක්‍රමානුකූලව අපි ඉදිරිපත් කරන්නේ. අපි හැම විටම රටේ ඒකීයභාවය ආරක්ෂා කරපු දේශපාලන පක්ෂයක්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි.

ගරු අගමැතිතුමාට මේ සම්බන්ධයෙන් යමක් සඳහන් කරන්න තිබෙනවාද?

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Mr. Chairman-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
Hon. Leader of the Opposition, we have a time constraint also, but go ahead please.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. RajavarothiamSampanthan)
We are engaged, Sir, in a very serious business of framing the fundamental law of this country. Parliament has constituted itself into a Constitutional Assembly which is performing this sacred duty. Today, we are sitting as the Constitutional Assembly and the Prime Minister has tabled before the Assembly six Reports submitted by six Subcommittees which were appointed by the Steering Committee and by the Constitutional Assembly in keeping with the Resolution adopted by the Constitutional Assembly when it commenced to function.

We are engaged in the process of considering various options and various alternatives in regard to various issues of importance at the Steering Committee. Eventually, the Report of the Steering Committee in regard to the Constitution will be submitted to this Assembly and discussed at this Assembly. If it is approved by this Assembly, it will be submitted to the Cabinet of Ministers and once approved by them, it will be submitted to Parliament. It must initially be approved by Parliament by a two-thirds majority. After it is approved by Parliament by a two-thirds majority, it must be approved by the people at a Referendum, because sovereignty is vested in the people; in no one else. The sovereignty of this country, in terms of our Constitution, which comprises of powers of governance, fundamental rights and the franchise, is vested in the people and consequently, whatever Parliament decides by a two-thirds majority, if the new Constitution is adopted by a two-thirds majority, it must be submitted to the people at a Referendum.

We are firmly of the view that there can be a new Constitution for this country only when that Constitution is approved by the people at a Referendum. We do not want anything done -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
Thank you very much, Hon. Leader of the Opposition. We have a time constraint here.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
We want the Constitution to be approved by all the people of this country because sovereignty is vested in the people.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. RanilWickremesinghe)

***නැඟීසිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
Hon. Prime Minister, I can give you just one minute.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. RanilWickremesinghe)
ගරු සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවේ කිසිම පක්ෂයට බහුතරයක් නොතිබීම ඇත්ත වශයෙන්ම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීමේදී එක අතකින් ශක්තියක්. අපට හැම කෙනාගේම අදහස්වලට ඇහුම් කන් දීලා තමයි ක්‍රියාත්මක කරන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ.

මම සඳහන් කළ පරිදි, මෙම විවාදය අපි ආරම්භ කරන්නේ 2017 ජනවාරි 9වැනි දා. ජනවාරි 9, 10 සහ 11 විවාද කළායින් පසුව එතැනින් අවසන් කරන්න වුවමනා නැහැ. ඊට පස්සේ රටේ විවාදයක් යන්න ඉඩ දීලා, අපට නැවත පෙබරවාරි හෝ මාර්තු මාසයේ මුණ ගැහෙන්න පුළුවන්, මේ පිළිබඳ අන්තිම අදහස් අරගන්න. මම රජයේ අදාළ අංශවලටත් කියලා තිබෙනවා, මේ වාර්තා සියල්ලම සකස් කරලා සාමාන්‍ය ජනතාවට ලැබෙන විධියට පන්සල්, පල්ලි, දේවස්ථාන හා පාසල්වලට බෙදන්න කියලා. ඒ වාගේම අපේ ලේකම්

කාර්යාල වෙබ් අඩවියක් දැම්මාම, ඒකත් ජනතාව අතරට යනවා. අපි හදන්නේ හැම කෙනාවම දැනුවත් කරන්න. අපි හදන්නේ අපේ ව්‍යවස්ථාව නොවෙයි; යූඑන්පී එකේ ව්‍යවස්ථාව නොවෙයි; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, ටීඑන්ඒ එකේ ව්‍යවස්ථාව නොවෙයි. අපි හදන්නේ රටේ ව්‍යවස්ථාව. ඒ නිසා මෙහි තිබෙන සමහර කරුණු ගැන මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, ජනාධිපතිතුමාගේ බලය කොතැනට ද යන්නේ කියලා. අන්තිමට ජනතාවයි තීරණය කරන්න ඕනෑ. අනික අපි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී ශර්වානන්ද, පාරින්ද රණසිංහ වනිසුරුතුමන්ලා දුන් තීන්දුවලින් ඉවත් වන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මම අවසාන වශයෙන් එක කාරණයක් කියන්න කැමැතියි, ගරු සභාපතිතුමනි. විපක්ෂ නායකතුමා කිව්වා, "ආණ්ඩුක්‍රමව්‍යවස්ථා කෙටුම්පත පාර්ලිමේන්තුවේ අනුමත කරලා මදි. පාර්ලිමේන්තුව පමණක් නොවෙයි, ජනමත විචාරණයකට යන්න" කියලා. එතුමා අපට කියන්නේ, නව ව්‍යවස්ථාව මේ රටේ බහුතර ජනතාව; සිංහල ජනතාවත් අනුමත කරන්න ඕනෑ කියලායි. ඊට වඩා දෙයක් අපට නැහැ නේ!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர்அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි, අගමැතිතුමනි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු සභාපතිතුමනි, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නයවිමසනලදින්, සභාසම්මතවිය.***
*வினாவிடுக்கப்பட்டுஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය ඊට අනුකූලව පූ.භා.9.25ට , 2016 දෙසැම්බර් මස 10 වන සෙනසුරාදා පූ.භා. 9.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படிமு.ப. 9.25 மணிக்கு அரசியலமைப்புச்சபை, 2016 டிசம்பர் 10ஆந் திகதி, சனிக்கிழமை மு.ப. 9.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Constitutional Assembly adjourned accordingly at 9.25 a.m. until 9.00 a.m. on Saturday, 10th December, 2016.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.